කුමාරි ලියනාරච්චි

ගම් දනව් සිසාරා සෙත සදන ගිලන් රථ සේවාව

ප්‍රවීණ රංගධර සිරිල් ධර්මවර්ධනයන්ගේ අභාවයත් සමග ඔහුගේ ආදරණීය එකම පුත් බිනර ධර්මවරධන මහතාගේ සංකල්පයකට අනුව ඔහුගේ ප්‍රධානත්වයෙන් ''සිරිල් ධර්මවර්ධන පදනම'' ආරම්භ විය. මෙකී ව්‍යාපෘතිය පිහටුවා ගැනීමේ මූලික අරමුණ වූයේ පිළිකා රෝගයට ගොදුරුව ඉතා අසාධ්‍ය තත්වයෙන් පෙළෙන අන්ත අසරණ තත්වයට පත්වූ රෝගීන් ශල්‍ය කර්ම පිළිකා නාශක බෙහෙත් (විකිරණ) ප්‍රතිකාර වලට යොමුවීමෙන් අනතුරුව පොදු ප්‍රවාහන සේවා වලින් තොරව සුව පහසුවට ගමන් පහසුකම් සලසා දීමය. එවන් ප්‍රතිකාරයකින් පසුව ගතට සිතට දැනෙන වේදනාව වදන් වලට පෙරලිය නොහැකිය. ඒ රිදුම් දෙන රෝගීන්ට නිදහසේ තම නිවස කරා සුව පහසුවේ ගමන් කිරීමට ලැබේනම් එය කොතරම් සහනයක්ද ? ආර්ථික අතින් ශක්තිමත් නොවූ මේ රෝගී බොහෝ විට තම නිවෙස් කරා යන්නේ රස්නය හා දුහුවිලි වලින් පිරුණු පොදු ප්‍රවාහන සේවා භාවිතා කරමිනි. එවිට වේදනාව තව තවත් තීව්‍ර වන බැව් නොකිව මනාය. මේ සියල්ලෙන් මුදවාලනු වස් තම මව්බිමට ගිලන් රථයක් පරිත්‍යාග කිරීම ඒවා නඩත්තු කිරීමත් පදනම සතු මූලිකාභිලාශයන්ය.

ඕස්ට්‍රේලියාව වැනි සියළු පහසුකම් වලින් හෙබි රටක දිව සරින අපට අප ඉපිද හැදී වැඩුන අධ්‍යාපනය ලද ලක්මවට කිසියම් අන්දමකින් හෝ උපකාරයක් කිරීමට තිබේ නම් එය අපට වාසනාවකි. කෘත ගුණ සැලකීමකි. එය අප සැමගේ යුතුකමක් මෙන්ම වගකීමද වන්නේය.

සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ලක්මව මුහුණ පාන ගැටළු රැස ආර්ථික දේශපාලනික සාමාජීය ගැටළු වලට මුහුණ දෙන ලක්මවටත් එහි වෙසෙන අපේ ජනතාවටත් සෞඛ්‍ය සම්පන්න දිවි පෙවෙතකට දිරිය ශක්තිය ලබාදීම මෙලොව පරලොව සුබ සිද්ධියට හේතු පාදක වන්නේය.

එදා ගිලන් රථ 2 කින් ඇරඹි මේ සේවාව අද වන විට ගිලන් රථ 06 දක්වා වර්ධනය වී ඇත. බොහෝ විට සමාජ සංවිධානවල හා පෞද්ගලික දානපතියන් ගේ උපකාරය ඇතිව මේ සේවාව බොහෝ සාර්ථක ලෙස ක්‍රියාත්මක වනු දක්නට ලැබේ.

ජන ජීවිත රැසකට සෙත සදන්නට ඇවැසි ගිලන් රථ මිලට ගෙන ලබා දීමෙන් හා නඩත්තු කටයුතු වෙනුවෙන් අමිල සේවාවන් රැසක් සිදු කල පිරිස සිරිල් ධර්මවර්ධන පදනම සිහිපත් කරන්නේ ගෞරව සම්ප්‍රයුක්තව. ප්‍රථමයෙන්ම මෙම ව්‍යාපෘතියට ප්‍රගෝනාමි ආරම්භයක් ලබාදුන් උතුරු මෙල්බන් වැඩිහිටි සංගමයටත්, එමෙන්ම එමග යමින් තම පවුලේ මියගිය ඥාතීන් වෙනුවෙන් පවුලේ රාශියක්ම දායකත්වය ලබා දී ඇත. ඒ අය පිළිබඳව සඳහන් කලහොත් ආචාර්ය කරු ලියනාරච්චි මහතාට සහ කමලී මහත්මියට පිං පිණිස එරිකා සහ මේරි ජින්ජර් මහත්මිය අප්සරා සෝමවංශ මහත්මිය ගිලන් රථ මිලදී ගනිමින් මේ මහඟු කාර්යයට දායක විය. යෙයට අමතරව වැටුප් සහ නඩත්තු කටයුතු උදෙසා ඩී සිල්වා එකවුන්ටින් ආයතනය මගින් මුදලක් ලබා දී ඇත.

එමෙන්ම මාසික දායකත්වය දෙන අයද මේ අතර සිටින වග සඳහන් කල යුතුමය. /
මේ ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට භාණ්ඩ හා සේවා සපයන්නන්ගේ ආධාර උපකාර ඊටම නොදෙවෙනි තැනක් ගනී. මෙලෙස සේව සැපයුවන් අතර පහත නම් සඳහන් අය ප්‍රධාන තැනක් ගනී.

චාවේරි බොඩි රිපේයර්
මෝබයිල් මැකැනික්ස්
පෙරේරා වෝටර් ඉන්ජිනියරින්
සනි ටයර්ස්, කොන්ටිනෙන්ටල් ටයර්ස්,
ඩැංඩිනොං, AG ඩිසල්, ඔටෝ ප්‍රොස්ටි,
ට්‍රාන්ස්ගේට් ඉන්ජිනියරින්, ට්‍රාන්ස් ප්‍රීට්ස්, ප්‍රයිම් සර්ව් ඔස්ට්‍රේලියා, හඳි බොඩිවර්ක්ස්, ශ්‍රී ලක් ඔටෝමෝටිව්, DE ඔටෝමෝටිව්, R ඔටෝ මොබයිල්ස්, RNC ඔටෝ ඉලෙක්ට්‍රිකල්, බන් වර්ක් ඕටෝමෝටිව්ස්, කීන් ග්‍රැෆික්ස්, කොම් පවර් සහ ටජ් ට්‍රාන්ස්පෝර්ට්.

මෙම සද් කාර්ය නොකඩවා පවත්වා ගැනීම සඳහා දායකත්වය සපයන පිරිසඳ අපමණය. ඒ අතර ගෝ ට්‍රැවල්ස, ඩිල්මා ටේ, මේ ටෙක්, ඒ එෆ් එල් ක්‍රිකට් ඔස්ට්‍රේලියා, ඔස්ලේන්, ඇරිටා, කිං කොයිල්, ඒ එන් එසෙන් කෝප් බැංකුව, බැන්ක් ඔෆ් ක්විස්ලෑන්ඩ් වෙස්කෝ වයිස් ෂෝප්, සිනමන්ස්, ටරිඩිදැඩ් 3, දෙරන ෆුඩ්ස්, මහේන්ද්‍රස්, එස්කේඑස්, එච්සිඑම්, කළම්බු කාගීල්ස්, ටුවල් ග්ලේන්, ජෙට් ට්‍රැවල් හා ක්‍රෑෂ් ග්‍රෙටර් ඩැංඩිනොං කවුන්සිලය, මොනෑෂ් සිටි කවුන්සිලය මේ අතර ප්‍රධානය.

මේ සියල්ලටම අමතරව මාධ්‍ය අනුග්‍රහය ලබා දෙන්නේ ශ්‍රී ලංකා මෝනිං හෝ 3ZZZ, රංජිත් සහ රණ්ඩි, ලක් මිහිර යන මාධ්‍ය ආයතනයන්ය. සංගීත හා නර්ථන දායකත්වය බැන්ඩ් මිස්ට්‍රි සහ අමා නර්ථන කණ්ඩායම අමතක කළ නොහැකිය. ඔස්ට්‍රේලියාවෙන් පමණක් නොව ශ්‍රී ලංකාවෙන්ද ගිලන් රථ සේවාව අර්ථවත්ව සිදුකර ගෙන යාම උදෙසා ඉමහත් සේවාවන් රැසක් සිදුවූ කෙරේ. ගිලන් රථ වල සියළු නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ ඩිමෝ මර්සිඩීස් බෙන්ස් ආයතනය මිල කළ නොහැකි සේවාවන් රැසක් ඉටු කොට දෙයි. කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ආයතනයද ඊටම නොදෙවෙනි සද් කාර්යක් ලබා දෙයි. එමෙන්ම කඩත්තු කටයුතු ටයර්ඩීම් - කළුබෝවිල, ජෝන් කීල්ස්, පෙරේවින්, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්, සිෆානි ජුවලර්ස් සහ ජනශක්ති දැවැන්ත පරිත්‍යාග ශිල්පීන්ය.

එරට මෙරට යා කරමින් ජාත්‍යන්තරයේ අවධානය පරිත්‍යාගයන්ද ලැබීමට තරම් මෙකී ව්‍යාපෘතිය වාසනාවන්ත විය. අන්තර්ජාතික සමාගම් අතර මැලේෂියන් ගුවන් සමාගම හා ගගග ඝර්ථ ෂිපිං ආයතනය විශාල වශයෙන් ආධාර උපකාර කොට ඇත. මේ සියළු දෙනාගේම දායකත්වය නොලැබෙන්නට ධර්මවර්ධන පදනමෙහි අරමුණු සිහිනයක් වන්නට ඉඩ තිබුණි. එහෙත් මේ සා විශාල දානපතියන් රැසකගේ දායකත්වය නිසාවෙන්ම සිහින සැබෑ වී අද වන විට අතු පතර ලියලා වැඩෙන විශාල රුකක් බවට පත්ව හමාරය. ආ මග කෙටිය, යා යුතු දුර බොහෝය. ඒක ව්‍යාපෘතියක සාර්ථකත්වය දෙස බලමින් මේ වන විට තවත් මිනිස් ජීවිත රැසකට ජීවිතය දිගු කරන ව්‍යාපෘතියකට සියළු කටයුතු සංවිධානය කොට හමාරය. ඒ වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන් සඳහා රුධිරය පිරිසිදු කිරීමේ උතුම් කාර්යයයි. ඔස්ට්‍රේලියාවේ ප්‍රධාන රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන් සහ ඒ සඳහාම පලපුරුදු හෙදියන්ගේ අධීක්ෂණය සහ වෛද්‍ය කාර්ය මණ්ඩලවල සහයෝගය ඇතිව මේ වන විට සිරිල් ධර්මවර්ධන පදනම යෝධ පිම්මක් යේධ මංගල පියවරක් තබා ඇති බව ආඩම්බරයෙන් පැවසිය යුතුවේ. ඇත ගම්දනව් වල ජීවත් වන රෝගී තත්වයෙන් පෙළෙන අහිංසක මිනිසුන් හට රුධිරය පිරිසිදු කර ගැනීම සඳහා බෝ දුර බැහැර ගෙවා රෝහල් කරා පැමිණිය යුතුව තිබේ. ඒ කටයුත්ත අතිශය දුෂ්කරය. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට ජංගම ලේ පිරිසිදු කිරීමේ යන්ත්‍රයක් සහිත ගිලන්රථ සේවයක් ලබා දීම තුළින් ජීවිතය මදකට හෝ අස්වැසිල්ලක් හිමි වනු ඇත.

තම ගම්බිම් වලට සමීප ස්ථානයකට පැමිණ ලේ මැරුකිරීමේ කටයුත්ත මුදල් ගෙවීමකින් තොරව සිදුකර ගැනීමේ භාග්‍ය අද වන විට වකුගඩු අකර්මණ්‍ය වූ රෝගීන්ට ගිමි වී ඇත. එය ජංගම ලේ ලබාගැනීමේ මධ්‍යස්ථානයක් වැනිය.

සිරිල් ධර්මවර්ධන පදනම සියළු දෙනාමට පොදුවෙ ගෞරවණීය ආරාධනාවක් කරන අතර ඒ මෙම පදනමේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ඔබ සතු සුවිශේෂී හැකියාවන් අදහස් යෝජනා සමගින් මෙම කටයුත්ත අති සාර්ථක කරගැනීම සඳහා ඔවුන් සමග එක්රොක් වන ලෙසයි. සමස්ථ ශ්‍රී ලංකාව පුරාම මේ සියළු සේවාවන් ව්‍යාප්ත කිරීමට නම් විද්වත් කුසලතාවන්ගෙන් හෙබි ඔබ සැමගේ දායකත්ව මිට ඇවැසිය. මේ සඳහා කැමැත්තක් දක්වන්නේ නම් වැඩි දුර විස්තර දැනගැනීම සඳහා පහත සැඳහන් දුරකථන මාර්ග ඔස්සේ ඔවුන් සම්බන්ධ කරගත හැකිය.

ඔස්ට්‍රේලියාව - 6143297779
ශ්‍රී ලංකාව - 94777797933

දුර බැහැර ගම් දනව් වල සිට පැමිණන රෝගීන් නිවෙස් කරා ඇරලවීමට දිනකට කිහිප වතාවක්ම එහා මෙහා ධාවනය කිරීමට ඉන්ධන රියදුරු වේතන සඳහා, නඩත්තු සඳහා මුදල් අවශ්‍ය වේ. මේ සද්කාර්ය දිගමට පවත්වා ගෙන යාමට නම් ඔබේ දායකත්වය නොඳෙව ඇවැසි වේ. ඒ මන්ද යත් රෝගී තත්වයෙන් පෙළෙන ජනතාවට කිසියම් සහනයක් සැලසීමේ පරම චේතනාවෙන් ඔබවත් මේ සඳහා දායක වීමට විවිධ ක්‍රම ඇත. ඒ ගිලන් රථයක් මිලදී ගෙන පරිත්‍යාග කිරීමෙන් හෝ නඩත්තු කිරීමට දිනයක් දින කිහිපයක් වෙන්කරවා ගැනීම තුළිනි. විටෙක අප සාද පවත්වමින් නොඑසේනම් අනවශ්‍ය වියපැහැදම් කරමින් මුදල් නිකරුනේ විය පැහැදම් කර දමයි. උපන්දින සිහිකරමින් තමාගේ මිය ගිය ඥාතීන් සිහිකර පිංපතා ගිලන් රථයක නඩත්තු කටයුතු වෙනුවෙන් /100ශ00 ක මුදලක් ලබා දීම තුළින් ජීවිත රැසකට සෞඛ්‍ය සම්පන්න ජීවිත ලබා දීමට කිසියම් වූ රුකුලක් ලැබෙනු නොඅනුමානය.

බොහෝ විට අප දිනපතා වියදම් කරන සිගරට් එකක ලොතරැයියකට, කෝපි කෝප්පයක මුදල් එකතු කර දිනයක් වෙන්කර ගැනීමෙන් මේ සද්කාර්යට ඔබට දායක විය හැකිය.

ඔබ තවමත් ප්‍රමාද නැත. සුන්දර සිතිවිල්ලක යහපත් ප්‍රතිඵල තවත් ජීවිත රැසක් සුවපත් කරනු ඇත. සැමට හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම එතරම් අසීරු කටයුත්තක් නොවේ. අප හැම විටම සහෝදරත්වයේ දෑත් දිගු කළ යුතුය.

මෙම පදනම මුලිකව සිදු කරනු ලබන මේ ගිලන් රථ සේවාව නිසාවෙන් සුවසේ තම නිවහන කරා ගමන් ගන්නා රෝගීන් අපමණය. ඔවුන්ගේ වෙහෙසකර ගත සිතට කිසියම් සුවයක් ලබා දකී, දෑස් අඟට සිනා මල් කැන්දන වගනම් නොකිව මනාය.

වර්තමානයේ Face book නොඑසේනම් මුහුණු පොත සමාජ ජාලා, වෙඩ් අඩව් සැනෙකින් පුවත් දැනගන්නට කදිම මාර්ගයකි. සිරිල් ධර්මවර්ධන පදනම පිළිබඳව සහ එමගින් කෙරෙන කාර්ය පිළිබඳව දැනුවත් වන්නට ඇති හොඳම තෝතැන්න Cyril Dharmawardaí Foundation මුහුණු පොතය.

එයට පිවිසීමෙන් රෝගීන්ගේ හදවතින්ම නැගෙන සතුට වචනයට පෙරලෙන අන්දමත්, ඔවුනගේ පවුල්වල අයගේ අදහස් දක්වන අන්දමත් විඩියෝ පට මගින් බලා ගැනීමට ඉඩහසර ලැබේ.

ගිලන් රථයක් මගින් ඇරලවීමේ සේවාවන් ලබා දීමේ ගෞරවය ධර්මවර්ධන පදනමට ගිමි වේ. මේ වන විට ශ්‍රී ලංකාවට ඉන්දීය රජය මගින් ගිලන් රථ සේවාවක් ආරම්භ කොට ඇත. බදු මුදල් ගෙවන්නන් ගේ ආදායමෙන් ඩොලර් මිලියන 10 මුදලක් වියදම් කොට අරාමය ලද මෙම සේවා දායකත්වය ලබන්නේ හදිසි ප්‍රතිකාර ඇවසි රෝගීන් පමණි. එහෙත් ධර්මවර්ධන පදනම තුළින් හදිසි නොවන එහෙත් පිළිකා වැනි රෝගී තත්වයෙන් පෙළෙන ප්‍රතිකාරවලින් පසුව නිවෙස් කරා යාමට ඇවැසි රෝගීන්ට මෙම සේවාව නොමිලයේම ලබා ගැනීමට පුළුවන. ඒ ශ්‍රී ලංකාවේ මෙන්ම මෙල්බර්න් හි වාසය කරන කාරුණික දානපතියන්ගේ අනුග්‍රහය සහ ආශීර්වාදය නිසාවෙනි. බුදු වදනට අනුව අප කරන හොඳ නරක හිබඳ අප පසුපස පැමිණේ.

අප හදවත් උණුවෙන තරමටම, අප අන් අය වෙත දෙන තරමටම තවත් යෙහෙකතුගේ ජීවිතය සුවපත් වනු ඇත. එය දැක බලා අසා අපට සතුටට පත්වීමට පුළුවන. මේ වන විටත් සිරිල් ධර්මවර්ධන පදනම බොහෝ සද්කාර්යයන් හි නිමග්න වෙමින් අප උපන් මව් බිමට අමිල සේවාවන් රැසක් සිදු කරන අතර, තවත් දැය හිතකාමී ව්‍යාපෘතිවල නියැලෙමින් බොහෝ දුර ගමනක් යන්නට මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව වෙහෙස මහන්සි වී වැඩ කරන, ක්‍රියාකාරී වන සියළු දෙනාට ඇවැසි දිරිය, ශක්තිය නිබඳවම ලැබේවායි පතමි.